BPU/CONF2012/007

# නූතන සිංහල බොදුගීතය තුළින් පිළිබිඹු කෙරෙන බොදුබැතිය හා සදාචාර වර්ධනයෙහි ලා එහි පෙළැඹවීම පිළිබඳ සංඥාර්ථවේදී විමර්ශනයක්

ආචාර්ය සේන නානායක්කාර[1]

කලාව යනු මිනිස් සිත තුළ හටගන්නා වඩාත් විශිෂ්ටතම හා උත්තරීතර ම හැඟීම් අන්‍යයන් වෙත සම්ප්‍රේෂණය කෙරෙන සුවිශේෂී මානව ක්‍රියාවලියකි. රැඟුම්, ගැයුම්, වැයුම් හෝ චිත්‍රය, මූර්තිය, ලේඛනය ඈ සකලවිධ කලාවන් කෙරෙහි එකී සුභාෂිතය වලංගු වෙයි. ඒ අනුව, ගීතය ද එහි ආනුෂංගික විෂය පරාසයක් ලෙස අවිවාදිත ය. අර්ථසම්පන්න ගේය පද්‍යයෙහි ලා සුනිසි ලෙස සංයෝජනය වූ කර්ණ රසායන සංගීතයත්, සප්ත ස්වරය අනුදත් මධුරතර ගායන ලීලයත් එකට මුහුවූ කළ රස පූර්ණ ගීතයක නිෂ්පත්තිය සිදුකෙරේ. එය ශ්‍රාවක සිත් ප්‍රබෝධවත් කරයි. මානසික විශ්‍රාන්තිය ශ්‍රාවකයාට සමීප කරවයි. කවර තේමාවක් සම්බන්ධයෙන් වුව එතුළින් පිළිබිඹු කෙරෙන සන්නිවේදනය අතිශය ප්‍රබල වෙයි. නූතන සිංහල බොදුගීතය විෂයයෙහි ලා ගත්කල ද එකී ආස්ථානය නිරවද්‍ය ය. ඒ අනුව මෙම පර්යේෂණ අධ්‍යයනයෙන් අපේක්ෂා කරනුයේ නූතන සිංහල බොදුගීතය තුළින් පිළිබිඹු කෙරෙන බොදුබැතිය හා සදාචාර වර්ධනයෙහි ලා එහි පෙළැඹවීම පිළිබඳ අසංකීර්ණ විශ්ලේෂණය කි.

සංඥාර්ථ විද්‍යාවෙන් (Semiology) සිදුකෙරෙනුයේ කිසියම් සන්නිවේදනමය කාර්යභාරයක සැකැස්ම, ක්‍රියාකාරීත්වය හා

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. e-mail: senananayakkara@yahoo.com/ sena@rjt.ac.lk

ප්‍රතිඵලය ද අර්ථසම්පන්න ව විමසාබැලීම යි. එකී සන්නිවේදනමය කාර්යභාරයෙහි ලා භාවිත සංඥා (Signals) සංකේත (Symbols) හා ප්‍රතිරූප (Images) ඇතුළත් ක්‍රමවේද පිරික්සුම යි. ඒ අනුව, යම් කලා කෘතියක හෝ සංදේශගත ක්‍රියාවලියක අර්ථසම්පන්නභාවය විමර්ශනයෙහි ලා විද්‍යාත්මක මාර්ගෝපදේශකත්වය සොයනුයේ සංඥාර්ථවේදය තුළිනි. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවෙහි රක්ෂිත තැටිපටි ගබඩාව සතු, දනට නිරන්තර භාවිතයෙන් යුතු සිංහල බොදුගී නිර්මාණ 480 ක් පමණ එකිනෙක අන්තර්ගත විෂය විශ්ලේෂණයකට (Content Analysis) ලක්කිරීමත්, ඒ කෙරෙහි භාවිත භාෂාව හා නිර්මාණාත්මක ශිල්පීය සංලක්ෂණ පිළිබඳ සංඥාර්ථ විද්‍යානුකූල ව විමසා බැලීමත් මෙහි ක්‍රමවේදය ලෙස ගැනේ. සාහිත්‍යමය ගවේෂණය (Literary Survey) මෙන් ම ශ්‍රාවක සම්මුඛ සාකච්ඡා (Listeners discussion) මඟින් දත්ත ලබාගැනීම ද මෙහි දී අපේක්ෂා කෙරේ.

රසික සමාජය ග්‍රහණය කොට ගැණෙන බොදුබැතිය සහිත චිත්ත සමාධිය ද සදාචාර වර්ධනයෙහි ලා එතුළින් කෙරෙන මානසික පෙළැඹවීම ද මෙහි දී ගැඹුරින් සාකච්ඡා කෙරේ. සංඥාර්ථ විද්‍යාව තුළ එය ගැඹුරින් විවරණය කෙරෙනුයේ කවරාකාරයෙන් ද යන්නත්, ඒ සඳහා භාවිත සංඥාර්ථ පද්ධති (Signifier Systems) කෙබඳුද යන්නත් මෙහි අවධාරිත ය.

ප්‍රමුඛපදඃ

කලාව, ගේය පද්‍යය, සංඥාර්ථ විද්‍යාව, සංඥාර්ථ පද්ධති.